# තක්සේරු ගැනුම් මිළ ගෙවීමෙන් ඔබට ලැබෙන වාසි

- ✓ රජයේ ඉඩම සඳහා නීතයානුකූල හිමිකම් ලැබීම.
- ✓ ඔබ පදිංචි හෝ භුක්ති විඳින ඉඩමට ස්ථිර බලපත්‍රයක් ලබාගත හැකි වීම.
- ✓ ඉඩමෙහි පදිංචියට හෝ සංවර්ධනයට අවසරය ලැබීම.
- ✓ ඔබගේ කලත්‍රයාට/ දරුවන්ට ඉඩමෙහි හිමිකම් පවරාදීමට හැකිවීම.
- ✓ දරුවන්ට හෝ 3 වන උපලේඛනගත ඥාතීන්ට ඉඩමෙහි උරුමය පවරාදීමට හැකිවීම.
- ✓ තක්සේරු දෙපාර්තමේන්තුවෙහි තක්සේරු ගැනුම් මිළ සම්පූර්ණයෙන් ගෙවීමෙන් පසුව දීමනාපත්‍රයක් (ඔප්පුවක්) ලබාගැනීමට හැකියාව ලැබීම.
- ✓ දීමනාපත්‍රයක් ලබාගැනීමෙන් පසුව එම ඉඩම පිළිගත් මූල්‍ය ආයතනයකට හෝ බැංකුවට උකසට තබා ණය මුදලක් ලබාගත හැකි වීම.
- ✓ දීමනාපත්‍රය පවුලේ අයෙකුට ලේ ඥාතීත්වය මත පවරාදීමට හැකියාව ලැබීම.
- ✓ දීමනාපත්‍රය පවුලෙන් පිට පැවරීම් කිරිමේදී ඇති සීමා ලිහිල් වීම. (ගැනුම් මිළ නොගෙවා ගොවි පන්තියේ ලෙස නොමිලේ නිකුත් කර ඇති දීමනාපත්‍ර ඉඩමක් පවුලෙන් පිට පැවරීමේදී පැවරුම්ලාභියා ගොවි පන්තියට ඇතුළත් වීම පිළිබඳ විශේෂයෙන් පරික්ෂා කර බලන නමුත් ගැනුම් මිළ ගෙවා ලබාගන්නා දීමනාපත්‍රයකදී වැඩි හෝ අඩු ආදායම් කාණ්ඩයේ ඕනෑම අයකුට පවරාදීමට හැකියාව ලැබීම.)